විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2023.12.05
පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)

2023 වර්ෂයේ IV කාර්තු වෙහි IV වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2023.12.05 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

2023.12.05 වන දින පෙ.ව.9.30 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කේ.ආර්.අබේසිරිවර්ධන මයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එදින එතුමා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගෙන රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

සහභාගී වූ නිලධාරීන්

01. කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
02. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්‍ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
03. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරි - පළාත් ඉංජිනේරු කර්යාලය (බ.ප.)
04. එම්.කේ.සුගත් ද සිල්වා මයා - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
05. ඩී.ඩී.චන්ද්‍රානි සේනාවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
06. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
07. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
08. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
09. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බත්තරමුල්ල.
10. ජේ.එන්.වික්‍රමරත්න මයා - (පරිපාලන නිලධාරි රා.ආ,) - පළාත් ඉංජිනේරු කාර්යාංශය
11. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
12. එල්.එම්.පී.පෙරේරා මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය

ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්‍ෂණය ඔස්සේ සම්බන්ධ වන ලදි.

13. පී.ඩී,ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කොළඹ.
14. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මිගමුව.
15. එච්.ඒ.කේ.ආර්.පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හොරණ.
16. එෆ්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - පානදුර.
17. එච්.එස්.චන්දන මයා- ප්‍රාදේශීය ඉංජිනේරු - මීනුවන්ගොඩ.
18. ආර්.ඒ.විජයප්‍රිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - බියගම.
19. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - ගම්පහ.
20. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හෝමාගම.
21. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මතුගම.
22. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - වත්තල.
23. එස්.එස්.මිල්ලනියගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කළුතර.
24. ආර්.ඩබ්.සී.ගුණවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - රත්මලාන.

## 01. <u>පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම</u>

| | කාරණය | සාකච්ඡා වූ කරුණු/ තීරණ | වගකීම |
|---|---|---|---|
| 01 | මාසික බැංකු සැසඳුම් | මේ වන විට සියළුම කාර්යාල විසින් මෘදු පිටපත එවා ඇති බවත් ඒ ආකාරයෙන්ම දිගටම කරගෙන යන ලෙසත් අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදි. අදාල මස බැංකු සැසඳුම් ඊලග මස 15 දින වෙනකම්ම නොසිට හැකි ඉක්මනින් සතියක් වගේ ඇතුලත විගණනය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලෙස නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු |
| 02 | අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව ණය අය නොවිම. | සියළුම පළාත්පාලන ආයතන ප්‍රධානින් හා ප්‍රධාන ලේකම් සමඟ 2023.10.13 දින සාකච්ඡාවක් පවත්වා ඇති අතර එහිදි පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරුවී පැමිණි නිලධාරින්ගේ ණය ශේෂ තහවුරු කරගෙන එම ණය ශේෂ 2023.12.31 දිනට පෙර නිරිවුල් කිරිමට කටයුතු කරන ලෙසට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මුල්‍ය උපදේස් ලබාදි ඇති බව ප්‍රධාන ගණකාධිකාරි ප්‍රකාශ කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි |

| අනු අංකය | නිලධාරිගේ නම | තනතුර | ස්ථාන මාරුවී ගිය දිනය | 2023.11.30 දිනට අයවිමට ඇත ණය ශේෂය රු. |
|---|---|---|---|---|
| | පළාත් පාලන ආයතන වලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් | | | |
| 1 | ඒ.එස්.අමරසිංහ | කළ.සේවා. සහකාර | 2016.01.16 | 116,239.00 |
| 2 | පී.ජේ.එස්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2018.02.28 | 121,120.00 |
| 3 | එස්.එම්.වඩුගේ | කළමනාකරණ සහකාර | 2018.11.05 | 36,760.00 |
| 4 | සී.කේ.තාන්තුලාගේ | රියදුරු | 2019.06.03 | 87,978.00 |
| 5 | ඩබ්.ඒ.ටී.එස්. වනිගසුන්දර | කළමනාකරණ සහකාර | 2020.01.01 | 121,325.00 |
| 6 | ඩබ්.සී.එස්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.01.01 | 38,860.00 |
| 7 | පී.ජී.එල්.ආලෝකා | තාක්ෂණ නිළධාරි | 2020.02.10 | 126,722.00 |
| 8 | අයි.ජී.ආර්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.02.17 | 116,218.00 |
| 9 | එන්.පී.ඩබ්. ජයවර්ධන | සංවර්ධන නිලධාරි | 2021.12.15 | 59,846.00 |
| 10 | ඒ.එස්.ඒ.සිල්වා | තාක්ෂණ නිළධාරි | 2022.03.31 | 105,215.00 |
| 11 | ඩබ්.එස්.අබේවික්‍රම | කළමනාකරණ සහකාර | 2022.03.28 | ණය අයවී අවසන් |
| 12 | එස්.යූ.විමලසිරි | කළමනාකරණ සහකාර | 2023.01.01 | 130,000.00 |
| 13 | ආර්.පී.එස්.විදුරංග | කළමනාකරණ සේවා නිලධාරි | 2023.07.17 | 228,608.00 |
| | | | | **1,288,891.00** |

| | | | | |
|---|---|---|---|---|
| | රජයට /වෙනත් පළාත් සභාවකට /පළාත් සභාවේ වෙනත් කාර්යාලයකට ස්ථානමාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ - විදේශගත සේවය සඳහා | | | |
| 01 | එම්.එච්.ගුණසේකර | කළමනාකාරණ සේවා නිලධාරි | 2020.02.07 | 109,800 00 |
| | | කාර්තු වශයෙන් ණයවාරික නිරවුල් කරනු ලබයි. | | |
| | සේවය හැර ගොස් ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | | |
| 01 | ආර්.ජී.එම්.එම්. රණසිංහ | තාක්ෂණ නිලධාරි | 2013.01.15 | 119,689.00 |
| | | නඩු පැවරීම සඳහා ගොනුව ප්‍රධාන නීති නිලධාරි විසින් නීතිපති දෙපාර්තමේන්තු වෙත යොමු කරන ලද අතර එහිදී මෙම කරුණ සමථ මණ්ඩලයට යොමුකර එහි තීරණ දැනුම් දෙන ලෙස නීති නිලධාරි විසින් දැනුම් දී ඇත. මෙම නිලධාරිගේ ණය සම්බන්ධ තොරතුරු සමථ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ආයතන අංශය වෙත යොමු කර ඇත. | | |
| | වැඩ තහනම් කර ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | | |
| 01 | පී.ජී.එල්.එස්. පෙරේරා | විදුලි කාර්මික | 2019.12.03 | ණය ශේෂය පියවා අවසන් |

03 කල් ඉකුත්වූ තැන්පතු

මෙතෙක් නිදහස් නොකළ තැන්පතු මුදල් වලින් කොටසක් නිදහස් කර ඇති අතර තව දුරටත් නිරවුල් කිරීමට ඇති තැන්පතු ප්‍රමාණය 04 වන අතර එය පහත පරිදිවේ.

| 2023.11.30 දිනට | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලය | තැන්පතු සංඛ්‍යාව | වටිනාකම රු. | නිරවුල් නොකිරීමට හේතු |
| 1 | හෝමාගම | 01 | 49,943.55 | නිරවුල් කිරිමට කටයුතු කරමින් පවති |
| 2 | ගම්පහ | 02 | 441,707.00 | නිරවුල් කිරිමට කටයුතු කරමින් පවති. |
| 3 | මිනුවන්ගොඩ | 01 | 18,525.00 | නිරවුල් කිරිමට කටයුතු කරමින් පවති. |

2023.11.30 දින වන විට වසර දෙක ඉක්මවූ තැන්පතු 04 ක් පවතී.

ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක කොන්ත්‍රාත්කරුට අඩුපාඩු සැකසීමට බාරදී ඇති අවස්ථාවල ඔහු විසින් එම කාර්ය ඉටු කිරීම ප්‍රමාද කරන්නේ නම් ලිඛිතව අඩුපාඩු නිමකල යුතු කාලයක් ඔහු වෙත දන්වා එම දිනටද ඔහු විසින් එම කාර්ය ඉටු නොකරන්නේ නම් එම අඩුපාඩු වෙනත් කොන්ත්‍රාත් කරුවකු ලවා ඉටු කරවාගෙන කලින් කොන්ත්‍රාත් කරුගේ රැඳවුම් මුදලින් එම වියදම් ගෙවීමට කටයුතු කරලෙසත්, වසර දෙකට වැඩි සියළුම රැඳවුම් ආදායමට ගැනීමට කටයුතු කරන ලෙසත් අවශ්‍ය අවස්ථාවලදී ආදායමෙන් ආපසු ගෙන අදාල ආයතනයට ගෙවීමට කටයුතු කරන ලෙසත් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුවන්ට දැනුවත් කරන ලදී.

නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු)

ප්‍රධාන ගණකාධිකාරී /

ගණකාධිකාරී /

සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු

| | | | |
|---|---|---|---|
| 04 | මීගමුව ධීවර සමිතිය | 1. මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටි භූමිය හා නව කාර්යාලය පිහිටි භූමිය ප්‍රාදේශීය ලේකම් වෙතින් පළාත් සභාවට පවරා ගැනිමට සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ පවත්වනු ලබන මිළඟ සාකච්ඡාවට මෙම ගැටළුව සම්බන්ධ කරුණු ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණද ප්‍රාදේශීය ලෙක්ම්වරුන් සමඟ පවත්වන සාකච්ඡාවේ න්‍යාය පත්‍රය සකසා අවසන් බැවින් මෙවර එම රුස්විමට මෙම කරුන ඇතුලත් කරගැනිමට නොහැකි විය.<br><br>තවද මෙම ඉඩම පළාත් සභාවට පවරාගැනිම සම්බන්ධව වෙනම සාකච්ඡාවක් නි.ප්‍ර.ලේකම් (ඉංජනේරු) හා මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු සමඟ පවත්වා ඉන්පසු කම්ටුවක්පත් පත්කර එයට ප්‍රාදේශීය ලේකම්ද සම්බන්ධකර ගෙන සාකච්ඡා පැවැත්විමට තීරණ විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි(රා.ආ)/ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු |
| | අවිස්සාවේල්ල ඉඩම | 2. 2023.11.22 දින ප්‍රධාන ලේකම් (බ.ප.)ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පවත්වන ලද අතර එහිදි පහත සඳහන් තිරණයන්ට එළඹි බව නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් පවසන ලදි.<br><br>❖ ඉහත ගොඩනැගිල්ල සහිත පරිශ්‍රය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාමට මාස 06 ක් ඉදිරියට ලබා දෙන අතර ඉන් පසු මෙම ගොඩනැගිල්ල සහිත භූමිය බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය වෙත භාර දිමට කටයුතු කළ යුතු බවට තීරණය කරන ලද බවත්,<br><br>❖ 2023 ජුනි මස සිට මේ දක්වා තිබෙන මාසිකව රු.20,000/- බැගින් වූ හිඟ බදු මුදල් 2023.12.31 වන දිනට පෙර ගෙවීම් කරන ලෙස ප්රධාන ලේකම් විසින් දැනුම් දෙන ලද බවත්,<br><br>❖ ඉදිරි මාස 06 ට අදාල මාසික ගෙවිම් අයකර ගැනිමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරිමටත් කිරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි (රා.ආ)/ හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 05 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | මෙම ලිපි ගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල මේ වන විට ක්‍රියාත්මක වන බවත්, Process Automation ක්‍රියාවලින්වල තැපැල හැරුණු විට අනෙකුත් ක්‍රියාවලින් ද නිම කර ඇති බවත්, ඊට අදාල User Accounts සියල්ලම ලැබී නොමැති බවත්, ලැබුණු User Accounts වලින් එම ක්‍රියාවලීන්හි පුහුණු කිරිම් ආරම්භ කර ඇති බවත්, සියළුම කාර්යමණ්ඩලයට ඊට අදාල පුහුණු වැඩ සටහන් සංවිධානය කර දෙන ලෙස ITRD ආයතනය වෙත දැනුම් දී ඇති බවත් අධ්‍යක්ෂ ඉංජින්රු විසින් පැහැදිලි කරන ලදි.<br><br>මෙම ලිපි ගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් පසු විපරම් කිරිමට ක්‍රම වේදයන් සැකසිම සුදුසු බව නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් පැහිදිලි කරන ලදි.<br><br>මෙම මෘදුකාංගය සඳහා විශාල වියදමක් දරා ඇති බැවින් එහි ප්‍රයෝජනය ලබා ගැනිමට කටයුතු කරන ලෙස අභ්‍යන්තර විගනක ප්‍රකාශ කරන ලදි. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්ෂ |

| | | | |
|---|---|---|---|
| 06 | වාහන පරිපාලනය සම්බන්ධ | 1. ර.ප.ච.ලේඛ 30/2016 හි 3.1 පරිච්ඡේදය ප්‍රකාරව මෙතෙක් පරීක්ෂා කර නොමැති කාර්යාල හැකි ඉක්මනින් ඉන්ධන පරීක්ෂව සිදු කිරීම (ප්‍රධාන කාර්යාලය, බියගම, පානදුර, බත්තරමුල්ල හා හෝමාගම කාර්යාලවලට ප්‍රධාන කාර්යාලයෙන් දී ඇති වාහන )<br><br>2. සියළුම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ධාවන සටහන් පොත් 2024 වර්ෂයේ සිට බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ 6 වන මහලේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණන කාර්යාලය වෙත එවීමට කටයුතු කරන ලෙස දැනුවත් කරන ලදි. | සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු/ පරිපාලන නිලධාරි (රා.ආ) |
| 08 | මාසික ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම හා අග්‍රිම ඉල්ලීම | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලින් මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීමේදි එම සාරාංශයන්හි ගැටළු රාශියක් පවතින බව ගණකාධිකාරි විසින් පැහිදිලි කරන ලදි. එම නිසා මාසික ගිණුම් සාරාංශ ප්‍රධාන කාර්යාලයට එවීමට පෙර පහත සඳහන් කරුණු පරීක්ෂාකර ඉදිරිපත් කරන ලෙස අවධාරනය කරනලදි .<br><br>මාසික ගිණුම් සාරාංශය සමඟ මාසයට අදාලව ගිණුම් ගත කල චත්කම් තොරතුරු නිවැරදිද යන්න, වැය විෂය අනුව කල වියදම්, පොදු තැන්පතු ලේඛනයේ ලැබීම් හා ගෙවීම්, ණය අත්තිකාරම් ගෙවීම් හා අයවීම්, මාසික ප්‍රේෂණ අදාල අදායම් ශීර්ෂ හා අනුව සටහන්ව ඇත්ද යන්න, ප්‍රධාන කාර්යාලයෙන් ලබාදී ඇති අග්‍රිම නිවැරදිව නියමිත මුදලම පොත්වලට ගෙන ඇතිද යන්න පරීක්ෂාකර ඉදිරිපත් කිරීම.<br><br>නියමිත දිනට ගිණුම් සාරාංශය ඉදිරිපත් නොකරන ලද කාර්යාල ලැයිස්තුවට පළාත් ඉංජිනේරු කාර්යාශයේ නමද ඇතුලත් වන බැවින්, මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර මාසය අවසන්වන තෙක් ගිණුම් සාරාංශ සැකසීමට නොසිට එදිනෙදා අදාල තොරතුරු සිගාස් වැඩ සටහනට අතුලත් කිරීමට කටයුතු කරන ලෙසද පැහැදිලි කරන ලදි.<br><br>ගිණුම් සාරාංශ සැකසීම ප්‍රමුඛ රාජකාරියක් ලෙස සලකා නියමිත දිනට නිවැරදිව ගිණුම් සාරාංශය ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලෙසත්, එක කර්යාලයක ප්‍රමාදයකින් ඉංජිනේරු කාර්යාංශයම අපහසුතාවයට පත්වන බැවින් මෙයට මුල්තැන දි කටයුතු කරන ලෙසත් දෛනිකව දහවල් 12.00 පෙර පළාත් භාණ්ඩාගාරයෙන් අග්‍රිම ඉල්ලුම්කල යුතු බැවින් ප්‍රදේශීය කාර්යාලවලට අවශ්‍ය මුදල් අවශ්‍යතා එදින දහවල් 12.00 පෙර ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලෙසත්, නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් උපදෙස් දෙන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි /<br><br>ගණකාධිකාරි /<br><br>සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |

**2 ) ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිගේ හා විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරීම්**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | කොවිඩ් වසංගත කාලයේ අතරමග නතර කර ගොස් තිබූ ඉදිකිරීම් අළුත් කොන්ත්‍රාත්කරුවන්ට පවරා ඇත්ද යන්න හා එවැනි ඉදිකිම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් නැවත සලකා බලන ලෙසත්, |
| 2 | බියගම මල්වතු හිරිපිටිය ව්‍යාපෘතියේ ප්‍රගතිය 26% ක පමණ ප්‍රතිශතයක් තිබුණ බවත් එහි කාර්ය සාධන සුරක්ෂණය සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බව, |
| 3. | බියගම උඩුපිල ග්‍රාමීය රෝහලේ අඩුපාඩු පැවත ඇති අතර එය නිසිපරිදි ඉටුකල බව වාර්තා කර ඇති බවත්, ඉදිකිරම සිදුකිරීමේදි ආයතන ප්‍රධානියාද සෑහීමකට පත්වන අයුරින් දෙපාර්ශවයේ එකඟතාවය මත සාකච්ඡාකර අළුත්වැඩියාවන් සිදු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි. |

| | |
|---|---|
| 4. | ඉදිකිරීම් වැඩ ප්‍රමාදයන් සිදුව ඇති බවත්, එකම කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් රාශීයත් ලබාදී ඇති බවත්, එම නිසා කොන්ත්‍රාත් සීමාව තුල කොන්ත්‍රාත් ලබාදිමත් , කොන්ත්‍රාත් කරුවන් කිහිපදෙනෙත් අතර වැඩ බෙදියාම සුදුසු බවත්, කොන්ත්‍රාත් ප්‍රමාද වීම් වලදි කොන්ත්රාත්කරුවන් සාධාරන හේතුවක් නොමැතිව වැඩ නොකරන්නේ නම් ප්‍රමාද ගාස්තු අයකිරිම හා කොන්ත්‍රාත් අවලංගු කර නව කොන්ත්‍රාත් කරුවන්ට ලබාදිම සුදුසු බවත් පෙන්වා දෙන ලදි. |

**(3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරිම්**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ හඳුනා නොගත් ලැබිම් දෙකක් ඇති බව 2023 ජුනි රු.10,000/ හා ජුලි - රු.25.00 |
| 2. | හෝමාගම සමහර ව්‍යාපෘතිහි ව්‍යාපෘතියේ අමතර වැඩ Extra works හා අතිරේක වැඩ Excess work 10% වැඩි අගයක් පවතින බව, Not Done විශාල ප්‍රමාණයක් ඇති බවත්, මේ නිසා ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සැකසිමේදි මේ සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු බව |
| 3. | හෝමගම වේරගල සෞඛ්‍ය මධ්‍යස්ථානයේ වැඩ අවසන්කර ඇතත් තවම භාරදි නොමැති බව. |
| 4. | සෑම නිලධාරියකුටම රාජකාරි ලැයිස්තුවක් ලබා දිම අනිවර්ය වුවද සමහර කාර්යාලවල රාජකාරි ලැයිස්තු ලබා දි නොමැති බව නිරීක්ෂණය වු බව. |
| 5 | වට්ටෝරු ලේඛණය, සවිකිරිම් ලේඛනය , පාරිභෝජය ලේඛන වෙන්වෙන් වශයෙන් පවත්වාගෙන යායුතු වුවද හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ එම ලේඛනවල ඇතුලත් කළයුතු සමහර අයිතමයන් පොත් මාරුකර සටහන් කර තිබු බව නිරීක්ෂණය විය |
| 6 | ව්‍යාපෘති සඳහා ගෙවිම් කිරිමේ දි වැට් සක්‍රියව පවතිද යන්න සම්බන්ධයෙන් නිරන්තර පරික්‍ෂාවෙන් සිටිය යුතු බව |

විගණන හා කළමනාකරණ කමිටු රැස්විම පවත්වා අදාල කරුණු සාකච්ඡා කිරිම ඉතා වැදගත් බවත්, එම කරුණු සම්බන්ධයෙන් විගණනයෙන් ලබාදෙන ලද වටිනා අදහස් රාජකාරි කටයුතු වලදි ඉතා ප්‍රයෝජනවත් බවත්, ඔබගේ වටිනා කාලය වැයකර මෙම රැස්වීම සඳහා සහභාගි විම සම්බන්ධයෙන් විගණන අධිකාරි, අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක, සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා අනෙකුත් සහභාගි වු සියළු නිලධාරින්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතියළුල කිරිමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පෙරවරු 12.15 ට පමණ අවසන් කරන ලදි.

කේ.ආර්.අබේසිරිවර්ධන මයා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 0112092524
ෆැක්ස් අංකය : 0112092523
විද්‍යුත් ලිපිනය : eng.org.acc@gmail.com